# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය** | **ඉතිහාසය - I**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1 යි

✶ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) වංසත්ථප්පකාසිනී කවර වංශකතාවකට ලියන ලද ටීකාවක් ද?
1) දීපවංශය 2) මහාවංශය 3) ථූපවංශය 4) බෝධිවංශය

02) පුරාණ කාලයට අයත් සාහිත්‍යය ආගමික තොරතුරු හා වංශකතා ලියවී ඇත්තේ
1) පුස්කොළ පොත්වල ය 2) ගල්පුවරුවල ය
3) කටාරම් අසල ය 4) රන්පත් හා තඹපත්වල ය

03) ශ්‍රී ලංකාවේ ජාතික උරුමයක් වූ පුරාවස්තු රැකගත යුත්තේ මින් කවර කරුණක් නිසා ද?
1) මතු පරපුරට පෙන්විය යුතු නිසා
2) ශ්‍රී ලාංකික අනන්‍යතාව පෙන්නුම් කිරීමට හේතුවන නිසා
3) අතීත පාලනය පිළිබඳ දැන ගැනීමට හැකිවන නිසා
4) සංචාරක ව්‍යාපාරය දියුණු කර ගැනීමට හැකිවන නිසා

04) මෙරට ශිලා ලිපි ලිවීම අඛණ්ඩව පැවති කාල සීමාව වන්නේ
1) ක්‍රි.පූ. පළමු සියවසේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා
2) ක්‍රි.ව. පළමු සියවසේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා
3) ක්‍රි.ව. දෙවන සියවසේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා
4) ක්‍රි.පූ. දෙවන සියවසේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා

05) පොළොන්නරු රාජ්‍ය සමයේ භාවිතා වූ කාසි වර්ගය වන්නේ
1) රන් කාසි 2) තඹ මස්ස කාසි
3) පුරාණ කාසි 4) ඇතා හා ස්වස්තික කාසි

06) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර පුළුස්සා අනුභව කළ බවට සාධක හමුවන ස්ථානය වන්නේ
1) කිතුල්වල බෙලි ලෙන 2) බෙලිලෙන බැඳි පැලැස්ස
3) පාහියංගල 4) මිනිහාගල්කන්ද

07) ක්‍රි.පූ. 7000 - 4500 කාලයේ දකුණු ආසියාවටම බලපෑ දේශගුණික විපර්යාසයක් සිදුවූ බව සැලකෙන යුගය වන්නේ
1) නව ශිලා යුගය 2) හොලෝසීයන යුගය
3) ප්ලයිස්ටෝසීයන යුගය 4) මුල් ඓතිහාසික යුගය

08) මුල් ඓතිහාසික යුගයේ ගංගා පිටාර නිම්නයෙන් පිටත විසූ මිනිසුන්ගේ ප්‍රධාන යැපීම් ක්‍රමය වූයේ
1) කුඹුරු ගොවිතැන 2) හේන් ගොවිතැන
3) වෙළඳාම 4) සත්ව පාලනය

09) රෝමයෙන් වීදුරු පබලු ගෙන්වා රුවන්වැලි සෑයට පබළු පූජාවක් සිදුකල පාලකයා වන්නේ
1) දුටුගැමුණු රජු 2) භාතිකාභය රජු
3) ගජබාහු රජු 4) පළමුවන විජයබාහු රජු

✶ A **සිට** I **දක්වා තොරතුරු ඇසුරින් 10, 11 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| A | විශාල ගල් පතුරු භාවිත කරයි. | D | විශාල මැටි බඳුනක් භාවිතා කරයි. | G | ඉබ්බන්කටුව, යටිගල් පොත්ත |
| B | හරණි සුසාන | E | මේ තුළ ඇට සැකිලි ආදාහනය කරයි. | H | පොම්පරිප්පුව |
| C | අමු මැටි යොදා සකස් කරයි. | F | හෂ්මාවශේෂ මැටි බඳුන් තැන්පත් කරයි. | I | රංචාමඩම |

10) හල්දුම්මුල්ල හා බෙරගල සුසාන භූමි කැණීමෙන් හමුවූ සුසාන වර්ග හා සම්බන්ධයෙන් ගැළපෙන පිළිතුර වන්නේ

1) A E I 2) C E I 3) C F G 4) B E H

11) ශිලා මංජුසා සොහොන් හා සම්බන්ධ පිළිතුර වන්නේ

1) A F G 2) A E H 3) A D G 4) B E G

12) පියාගෙන් පුතාට රජකම ලැබුණු අවස්ථාවකට නිදසුනක් වන්නේ

1) දුටුගැමුණුගෙන් සද්ධාතිස්සට 2) වසභගෙන් වංකනාසිත තිස්සට
3) දේවානම්පියතිස්සගෙන් උත්තියට 4) දුටුගැමුණුගෙන් කාවන්තිස්සට

13) I තීරුව II තීරුව සමඟ ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. බතගු | A- රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානියා |
| 2. කොතුරු ගෑ ගා | B- භෝජන ශාලා අධිකාරී |
| 3. පත අදෙක | C- වෙළඳ කටයුතු භාර ප්‍රධානියා |
| 4. කන පෙඩික | D- වත් සිරිත්, චාරිත්‍ර පිළිබඳ ප්‍රධානියා |

1) C D A B 2) B C D A 3) B D C A 4) B D A C

14) විහාරයේ දනය පිළිබඳව ගැටලුවක් ඇති වුවහොත් එය විසඳා ගැනීමට දසගම් ඇත්තන් හට පැවරූ බව සඳහන් සෙල්ලිපිය වන්නේ

1) බුද්ධන්නෙහෙල 2) මැදිරිගිරිය
3) කළුදිය පොකුණ 4) තෝනිගල

15) ලම්භකරන රාජවංශයේ ආරම්භක පාලකයා වන්නේ

1) පළමු විජයබාහු රජු 2) දුටුගැමුණු රජු
3) මහා පරාක්‍රමබාහු රාජු 4) වසභ රජු

16) ක්‍රි.ව. 9 වන සියවසේ අරාබි පාලකයන් සමඟ මෙරට පාලකයන් සමඟ තෑගි බෝග හුවමාරු කරගත් බවට සඳහන් කරන අරාබි ජාතිකයා වන්නේ

1) ඉබන් බතුතා 2) අල්බලසූරිය
3) ඉබන් ශක්රියර් 4) කොස්මෝස් ඉන්ඩිගෝප්ලේටස්

17) කැති අඩ හා කෙටු කනබ අය යන බදු වර්ග දෙක අහෝසි කල පාලකයා වන්නේ

1) පළමු විජයබාහු රජු 2) නිශ්ශංකමල්ල රජු
3) මහා පරාක්‍රමබාහු රජු 4) වසභ රජු

18) "අහසින් වැටෙන එක දිය බිඳුවක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතුයි." යන ප්‍රකාශය සිදුකල පාලකයා වන්නේ

1) දුටුගැමුණු රජු 2) වසභ රජු
3) මහා පරාක්‍රමබාහු රජු 4) පළමු පරාක්‍රමබාහු රජු

19) මාගම සිට අනුරාධපුරයට පැමිණ වෙළඳපොලකින් සුවඳ විලවුන් මිලදී ගත් බවට පැවසෙන්නේ

1) වේළුසුමන 2) සුරනිමල 3) තේරපුත්තාභය 4) නන්දිමිත්‍ර

20) හෝපිටිගමුව ටැම් ලිපිය කරවූ පාලකයා වන්නේ

1) IV වන උදය රජු
2) IV වන මිහිඳු රජු
3) I වන විජයබාහු රජු
4) IV වන කාශ්‍යප රජු

21) හම්බන්තොටින් හමු වූ ලෝහ මුද්‍රාව අයත් වෙළඳ සංවිධානය වන්නේ

1) නානාදේසි
2) අයින්නූරුවර්
3) බලක්කියාර්
4) කබොප් මහ පුගිය

22) මිහිඳු හිමියන් මෙරටට බුදු දහම රැගෙන පැමිණි සියබසය වන්නේ

1) ක්‍රි.පූ. 1 සියවස
2) ක්‍රි.පූ. 3 සියවස
3) ක්‍රි.ව. 1 සියවස
4) ක්‍රි.ව. 3 සියවස

23) අනුරාධපුර මහා විහාරයේ වැඩ වසමින් ත්‍රිපිටක ධර්මය විස්තර සහිත අටුවා රචනා කළ භික්ෂූන් වහන්සේ වන්නේ

1) බුද්ධඝෝෂ හිමි
2) පාහියන් හිමි
3) නාගර්ජුන හිමි
4) කුපික්කල තිස්ස හිමි

24) "සිවිකාශාලා" යනු

1) බ්‍රාහ්මණයින්ගේ ආගමික කටයුතු සිදුකළ ස්ථාන
2) ශිව ලිංග තැන්පත් කළ ස්ථාන
3) ශිව දෙවියන් යනුවෙන් තැනූ කෝවිල්
4) නෙස්ටෝරියානු නිකායට අයත් ආගමික ස්ථාන

25) පහත A, B, C යනුවෙන් දක්වා ඇති ග්‍රන්ථ අයත් භාෂා කාණ්ඩය නිවැරදිව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ

A- දීපවංශය, අභිධානප්පදීපිකාව, පාරජ්ජිදීපනී
B- ජානකීහරණය, බාලාවබෝධය, අනුරුද්ධසතකය
C- සියබස්ලකර, සසදාවත, මුවදෙව්දාවත

1) සිංහල, පාලි, සංස්කෘත
2) පාලි, සංස්කෘත, සිංහල
3) පාලි, සිංහල, සංස්කෘත
4) සංස්කෘත, පාලි, සිංහල

26) දකුණු ඉන්දියානු කුලී හමුදාවන්ගේ සහය ලබාගත් මෙරට පැරණිතම පාලකයින් දෙදෙනා වන්නේ

1) විජය රජු හා පණ්ඩුකාභය රජු
2) දුටුගැමුණු රජු හා දේවානම්පියතිස්ස රජු
3) පළමු විජයබාහු රජු හා නිශ්ශංක මල්ල
4) ඉලනාග රජු හා අභයනාග රජු

27) ඇළහැර ඇළ මගින් ජලය සපයන වැවක් නොවන්නේ

1) මින්නේරිය 2) ගිරිතලේ 3) කවුඩුල්ල 4) යෝධ වැව

28) අනුරාධපුර යුගයේ ඉදිකළ ගල් පාලමක කොටසක් හමුවන්නේ කුමන ගංගා නිම්නයේ ද?

1) මහවැලි 2) මල්වතු 3) කළා ඔය 4) මැණික් ගඟ

29) ජලයේ ප්‍රමිතිය හා සිසිලස ආරක්ෂා කර ගැනීම සඳහා ඉදිකළ නිර්මාණය වන්නේ

1) පොකුණු
2) උෟරා කැට ළිං
3) වැව්
4) ජල මල්

30) ගව්වෙන් ගව්ව ගැවුන කණු ඉදිකළ මෙරට පාලකයා වන්නේ

1) භාතිකාභය රු
2) නිශ්ශංකමල්ල රජු
3) දුටුගැමුණු රජු
4) පළමු විජයබාහු රජු

31) අවකාශ මැනීමට භාවිතා කළ මිම්මක් නොවන්නේ

1) කිරිය
2) වියත
3) අමුණ
4) පැල

32) ලාහුගල නිල්ගිරි සෑය අසලින් හමුවන සෙල්ලිපියක සඳහන් වන රූපික වන්නේ

1) කල්‍යාණවතී දේවි
2) ලීලාවතී දේව
3) සීවලී දේවි
4) අනුලාවතී දේවි

33) පැරණි සාහිත්‍යය මූලාශ්‍රවල "කරබෙඩිය" යනුවෙන් හඳුන්වා ඇත්තේ

1) කරපිංචා
2) කුළුබඩු
3) කැඳවර්ග
4) තෙල් වර්ග

34) මිනිසුන් බැඳ දමා වධකොට ධනය පැහැරගෙන දිළින්දන් කළහ සූනිම, බිඳ හෙලූහ, චෛත්‍ය විනාශ කළහ. මෙසේ මහාවංශයේ සඳහන් වන්නේ

1) රාජරාජ චෝල රජු
2) කාලිංග මාඝ
3) එළාර ආක්‍රමණය
4) රාජේන්ද්‍ර රාජ

35) වසර නවයක් පොළොන්නරුවේ පාලනය ගෙන ගිය පාලකයා වන්නේ

1) එළාර රජු
2) කල්‍යාණවතී රැජිණ
3) පළමු විජයබාහු රජු
4) පස්වන මිහිඳු රජු

36) දඹදෙණි රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ

1) පළමු විජයබාහු රජු
2) දෙවන විජයබාහු රජු
3) තුන්වන විජයබාහු රජු
4) සිව්වන විජයබාහු රජු

37) වැව් ජලය භාවිතකරන්නන්ගෙන් අයකළ බද්ද වන්නේ

1) දකපති
2) බොජකපති
3) මකරමජිබක
4) මාත්‍රික මත්ස්‍ය භාගය

38) සොරකම් කිරීම, මිනී මැරීම ආදී වරදයන් සඳහා දිය යුතු දඬුවම විස්තර කර ඇති සෙල්ලිපිය වන්නේ

1) මිහින්තලා පුවරු ලිපිය
2) වේවැල්කැටිය සෙල්ලිපිය
3) හෝපිටිගමුව සෙල්ලිපිය
4) සොරබොර වැව සෙල්ලිපිය

39) භාතිය තිස්ස රජුගේ කාලයේ තම දේපල වලින් කොටසක් බෞද්ධ විහාරයකට පූජාකළ කාන්තාව වන්නේ

1) චූලසීවලී දේවිය
2) කල්කා ලක්ෂ්මී දේවිය
3) කල්‍යාණවතී දේවිය
4) ලීලාවතී දේවිය

40) ශාසනයත් රටත් සතුරන්ගෙන් රැකගැනීම උදෙසා යාපහුව කඳු මුදුනේ දුර්ගයක් පිහිටුවා ගෙන එම ප්‍රදේශ රැකගත් නායකයා වන්නේ

1) සුභ සෙනෙවි
2) සංඛ සෙනෙවි
3) බුවනෙකබාහු ආදිපාද
4) දේව පතිරාජ සෙනෙවි